# අන්තර්ජාලය සහ සන්නිවේදනය

# SFT ප්‍රශ්න සහ පිළිතුරු

A/L Tech කරන හැමෝම ඉන්න ඕනෙ තැනක් **techlogiclk.com**

ජාතික අධ්‍යාපන දෙපාර්තුමේන්තුව මඟින් නිකුත් කළ Quiz Bank එකෙහි ඇති ප්‍රශ්න පාඩමෙන් පාඩමට වෙන් කළ සැකසූ PDF එකතුව.

## ඒකකය 14 - අන්තර්ජාලය සහ සන්නිවේනය

### බහුවරණ ප්‍රශ්න

1. අන්තර් ජාලය පිළිබඳ ව අසත්‍ය වන්නේ පහත සඳහන් කවරක් ද?
   1. එය කිසිවකුට අයත් නොවේ.
   2. බිල්ගේට්ස්ට අයත් වේ.
   3. එහි මධ්‍යගත පාලනයක් නැත.
   4. එය පරිගණක ජාල වල ජාලයකි.
   5. එයින් ලබා ගත හැකි තොරතුරු අතිශයින් නිවැරදි හෝ විශ්වාස දායක නොවේ.
2. අන්තර් ජාලයට පිවිසීමේ සේවා සපයනු ලබන සමාගමක් හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
   1. Server 2. Client 3. WÄN 4. ISP 5. COM
3. http://www.doenets.lk යනු කුමක් සඳහා නිදසුනක් ද?
   1. සේවා දායකයක් - සර්වර් (Server)
   2. එකීය සම්පත් පිහිටුමක් (URL- uniform resource locator)
   3. ජාලයක ප්‍රවේශ කේතයක් (an Access code of network)
   4. ආයතනයක විද්‍යුත් තැපැල් ලිපිනය (an E-mail Address of an organization)
   5. ප්‍රොක්සි සේවාවකි (Proxy Server)
4. අන්තර් ජාලයට සම්බන්ධ පහත වගන්ති සලකා බලන්න.
   A. අන්තර් ජාලයට සම්බන්ධ වීම සඳහා සෑම යන්ත්‍රයකට ම IP නමින් හැඳින්වෙන අනන්‍ය ලිපිනයක් අවශ්‍ය වේ.
   B. www යන්න විද්‍යුත් ලේඛන එකතුවකින් සමන්විත වේ.
   C. අන්තර් ජාලය හරහා ප්‍රවේශ විය හැකි HTML ලේඛනයක් වෙබ් පිටුවක් ලෙස හැඳින් වේ.

   ඉහත වගන්තිවලින් සත්‍ය වන්නේ
   1. A පමණි
   2. B පමණි
   3. C පමණි
   4. A හා B පමණි
   5. A,B හා C යන සියල්ල සත්‍ය වේ
5. පාසල් විද්‍යාගාරයක ඇති පරිගණක දෙකක් භාවිත කරමින් සිසුන් දෙදෙනෙකු එක ම වෙබ් අඩවියකට ප්‍රවේශ වේ. මෙම පරිගණක දෙකෙහි කුමක් වෙනස් ව පැවතිය යුතු ද?
   1. වෙබ් අතිරික්සුව (Web Browser)
   2. ලිපින (IP Addresses)
   3. අන්තර්ජාල සේවා සැපයුම්කරු (Internet Service Provider)
   4. මෙහෙයුම් පද්ධතිය (Operting System)
   5. සෙවුම් යන්ත්‍රය (Search Engine)
6. ලෝක විසිරි වියමන (World Wide Web) නිවැරදි ව පැහැදිලි කරන්නේ පහත කුමකින් ද?
   1. www ආයතනය විසින් පවත්වා ගෙන යන ලෝකයේ විශාලතම පරිගණක ජාලයයි.
   2. අන්තර් ජාලය සහ එහි ඇති සේවාවන් සඳහා දෙනු ලබන පොදු නාමයයි.
   3. අන්තර් ජාලය තුළ විද්‍යුත් ලේඛන ගබඩා කර තබන ස්ථානයයි.
   4. අන්තර් සම්බන්ධිත (Inter Linked) අධිපාඨ (Hyper Text) සහිත අන්තර් ජාලය හරහා සම්බන්ධ විය හැකි විද්‍යුත් ලේඛන පද්ධතියයි.
   5. චන්ද්‍රිකා සන්නිවේදනය මගින් ලොව වටා සාදා ඇති චුම්බක තරංග දැල වේ.
7. පහත සඳහන් ඒවා අතරින් නිවැරදි විද්‍යුත් තැපැල් (E-mail) ලිපින ආකෘතිය වන්නේ?
   1. www.galahitiyawacrc@gmail.com
   2. galahitiyawacrcgmail@com
   3. galahitiyawacrc@gmailcom
   4. galahitiyawacrc@gmail.com
   5. galahitiyawa@crc-gmail_com

8. විද්‍යුත් තැපැල භාවිත කොට ලිපි යැවීමේ දී BCC විශේෂාංගය භාවිත කළ හැකි ය. මෙහි BCC ලෙස කියවෙන්නේ?
   1. Build Computer Copy
   2. Blind Carbon Copy
   3. Binary Computer Code
   4. Basic Character Copy
   5. Binary Copy Code
9. අන්තර් ජාලය තුළ ඇති තොරතුරුවලට පිවිසීමේ දී URL යොදා ගනියි. මෙයින් කියවෙන්නේ?
   1. Universal Resource Location
   2. Universal Resource Locator
   3. Uniform Resource Locator
   4. Unique Resource Location
   5. Universal Record Location
10. "sc4tech@sltnet.lk"යන විද්‍යුත් ලිපිනයේ පරිශීලක නාමය වන්නේ?
   1. sltnet.lk
   2. lk
   3. sc4tech
   4. sltnet
   5. sc4tech@sltnet
11. තොරතුරු සොයන්නන් අතර විකිපීඩියා (Wikipedia) යනු ජනප්‍රිය වෙබ් අඩවියකි. පහත දී ඇති සේවා අතරින් විකිපීඩියා අයත් වන්නේ කුමන සේවාවට ද?
   1. සෙවුම් යන්ත්‍රය (Search Engine)
   2. අන්තර් ජාල විශ්ව කෝෂය (Internet En-cyclopedia)
   3. වෙබ් අතිරික්සුව (Web Browser)
   4. මයික්‍රෝබ්ලොගින් (Microblogging)
   5. සමාජ ජාල අඩවි (Social Network)
12. පහත දී ඇති URL වලින් වලංගු නො වන්නේ කුමක් ද?
   1. www.moe.gov.lk
   2. ftp://ftp.funet.fi
   3. https://www.google.com
   4. technology@nie.lk
   5. www.galahitiycrc.sch.lk
13. http://www.doenets.lk යන්න උදාහරණයක් වන්නේ පහත කුමකට ද?
   1. අන්තර් ජාල සේවා සපයන්නෙක් (ISP) සඳහා
   2. රහස්‍ය තොරතුරු ගබඩාවක් සඳහා
   3. URL ලිපිනයක් සඳහා
   4. ආයතනයක e-mail ලිපිනයක් සඳහා
   5. IP ලිපින සොයා දෙන සේවාවක් සඳහා
14. තම නිවසේ ඇති පරිගණකයෙන් අන්තර් ජාලයේ ඇති තොරතුරු ගවේෂණය කරන්නෙකුට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු මෘදුකාංගය පහත දී ඇති ඒවායින් කුමක් ද?
   1. www
   2. වෙබ් අතිරික්සුවක්
   3. ප්‍රතිවයිරස් මෘදුකාංගයක්
   4. සෙවුම් යන්ත්‍රයක්
   5. වෙබ් අඩවි නාමාවලියක්
15. අන්තර් ජාලය හරහා සිදු වන අනවසර ප්‍රවේශය වලක්වා ගැනීම සඳහා භාවිත වන්නේ?
   1. ගිනි පවුර (Firewall) උපාංගය
   2. ප්‍රතිවයිරස් මෘදුකාංගය (Anti-virus Software)
   3. රහස්‍ය අංකයක් (Password)
   4. නිර්බාධක ජව සැපයුමක් (UPS)
   5. ආරක්ෂක බහලුමක් (Folder Lock)

16. පහත ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශයක් වන්නේ?
    1. අන්තර් ජාල හරහා වෛද්‍ය සේවාවන් ලබාගත හැකි ය.
    2. මාර්ග ගත සාප්පු සවාරි (Online Shopping) සඳහා අන්තර් ජාලයට පිවිසීමට අත්‍යවශ්‍ය නොවීම.
    3. නිවසේ සිට පරිගණකය හා අන්තර් ජාලය භාවිත කර තම බැංකු ගිණුමෙන් විවිධ ගෙවීම් සිදු කළ හැකි ය.
    4. නිවසේ සිට රජයෙන් සපයන සේවා ලබාගැනීමට අන්තර් ජාලය භාවිත කළ හැකි ය.
    5. අන්තර් ජාලය හරහා කෙටි පණිවුඩ යැවීමට හැකි වීම.
17. විද්‍යුත් තැපැල් ලිපිනයක සෑම විට ම දක්නට ලැබෙන්නේ කවර සංකේත/සංකේතය ද?
    1. .com 2. _ 3. @
    4. :// 5. #
18. අන්තර් ජාලය හා ලෝක විසිරි වියමන සම්බන්ධයෙන් වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
    1. ලෝක විසිරි වියමන යනු අන්තර් ජාලය සඳහා යෙදෙන තවත් නාමයකි.
    2. අන්තර් ජාලය යනු ලෝක විසිරි වියමන විසින් ලබා දෙන සේවාවකි.
    3. ලෝක විසිරි වියමන යනු අන්තර් ජාලයේ සේවාවකි.
    4. ලෝක විසිරි වියමන යනු අන්තර් ජාලයේ සේවා සපයන්නන්ගේ සංවිධානයයි.
    5. ලෝක විසිරි වියමන යනු අන්තර් ජාල සේවාවේ මූලාරම්භයයි.
19. පහත දී ඇති ඒවායින් නිවැරදි ඒකීය සම්පත් නිශ්චකය (URL) තෝරන්න.
    1. http://www.nie.lk/tech/ 2. http://tech/www.nie.lk
    3. www.http://nie.tec.lk/Tech/ 4. ftp://tech/www.nie.lk
    5. http://ftp:/www.nielk/tech
20. පහත දී ඇති ඒවායින් වෙබ් අතිරික්සුවක් වන්නේ මොනවා ද?
    A. Opera
    B. Firefox
    C. Ubuntu
    1. A පමණි 2. B පමණි 3. A හා B පමණි
    4. B හා C පමණි 5. A,B හා C සියල්ල ම
21. වෙබ් අඩවියක ඇති වෙබ් පිටු එකිනෙක සම්බන්ධ කිරීමට භාවිත කරන්නේ කුමක් ද?
    1. අන්තර් ජාල නියමාවලිය (Internet Protocol)
    2. වෙබ් අතිරික්සුව
    3. ගොනු තැන් මාරු නියමාවලිය (File Transfer Protocol)
    4. අධිසන්ධි (Hyperlink)
    5. ජාල විධි (Network Mode)
22. විද්‍යුත් තැපැල භාවිතයේ දි CC සහ BCC යන ක්ෂේත්‍රවල විද්‍යුත් ලිපින ඇතුළත් කළ හැක. A සහ B නම් පුද්ගලයින් දෙදෙනෙකුට එක ම විද්‍යුත් ලිපියක් යැවීමේ දි A ගේ විද්‍යුත් තැපැල් ලිපිනය CC හීත් B ගේ විද්‍යුත් තැපැල් ලිපනය BCC හීත් ඇතුළත් කළේ නම් පහත ප්‍රකාශවලින් නිදොස් වන්නේ කුමක් ද?
    1. A ට ලිපිය ලද බව B නො දන්නා නමුත් B ට ලිපිය ලද බව A දනී.
    2. B ට ලිපිය ලද බව A නො දන්නා නමුත් A ට ලිපිය ලද බව B දනී
    3. එකිනෙකාට ලිපි ලැබුණු බව දෙදෙනා ම දනිති.
    4. එකිනෙකාට ලිපි ලැබුණු බව දෙදෙනා ම නො දනිති.
    5. A ට හා B ලිපි ලැබුණු බව දන්වමින් ලිපියේ තවත් පිටපතක් දෙදෙනාට ම ලැබීම.
23. පහත දී ඇති ඒවායින් අන්තර් ජාලය භාවිත කිරීම සඳහා අත්‍යවශ්‍ය ම (අංගය/අංගයන්) මොනවා ද?
    A. පරිගණකයක් වැනි උපකරණයක්
    B. අන්තර් ජාල සම්බන්ධතාවක්
    C. විද්‍යුත් තැපැල් ලිපිනයක්
    D. වෙබ් අතිරික්සුවක්
    1. A හා B පමණි 2. A,B හා C පමණි 3. A, B හා D පමණි
    4. B හා C පමණි 5. ඉහත සියල්ල ම

24. අන්තර් ජාල පහසුකම් සහිත පරිගණකයක් භාවිත කර වීඩියෝ සංවාදයක් කිරීම සඳහා අත්‍යවශ්‍ය වන්නේ පහත කුමක් ද?
    1. ජාල අතුරු මුහුණත් පතක් (Network Interface Card)
    2. වෙබ් අතිරික්සුවක්
    3. වෙබ් කැමරාවක්
    4. වසම් නාමයක් (Domain Name)
    5. මොඩමයක්
25. පාසල් විද්‍යාගාරයේ පරිගණක දෙකක සිටින සිසුන් දෙදෙනෙකු අතරින් එක් සිසුවෙකු තම පරිගණකය මගින් අනෙක් සිසුවාට ගොනුවක් යවනු ලබයි. ඉහත සිද්ධියට අදාළ ව වඩාත් ම නිවැරදි විය යුත්තේ කුමක් ද?
    1. දෙදෙනා ම එකම වෙබ් අතිරික්සුව භාවිත කරති.
    2. දෙදෙනාට ම විද්‍යුත් තැපැල් ලිපින දෙකක් තිබීම.
    3. දෙදෙනා ම එක ම මෙහෙයුම් පද්ධතිය භාවිත කිරීම.
    4. පරිගණක දෙක සඳහා IP ලිපින දෙකක් ඇත.
    5. දෙදෙනාට ම ගිනි පවුර තුළින් ගමන් කළ හැකි වීම.
26. www.nie.lk/grcxy/findcource.php යන URL ලිපිනයේ වසම් නාමය (Domain Name) කුමක් ද?
    1. nie.lk
    2. .lk
    3. findcource.php
    4. grcxy
    5. grcxy/findcource.php
27. වෙබ් අඩවියක් හඳුනා ගැනීම සඳහා වූ අනන්‍ය (Unique) නාමය කුමක් ද?
    1. IP ලිපිනය
    2. වසම් නාමය (Domain Name)
    3. ලෝක විසිරි වියමන (www)
    4. ඒකීය සම්පත් නිශ්චායකය (URL)
    5. විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail Address)
28. අන්තර් ජාලය හා සෘජුව ම සම්බන්ධ සේවාවක් නො වන්නේ
    1. ඉලෙක්ට්‍රෝනික තැපෑල
    2. ලිඛිත කතාබහ (Chatting)
    3. ගොනු හුවමාරුව (File Transfer )
    4. මුදල් හුවමාරුව (Money Transfering)
    5. වසම් නාම සේවාව (Domain Name Server)
29. ශිෂ්‍යයෙක් අන්තර් ජාල සම්බන්ධතාවක් ලබා ගෙන සිය අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණය කිරීමට බලාපොරොත්තු වෙයි. පහත දී ඇති ඒවායින් ඔහුට අවශ්‍ය වන්නේ මොනවා ද?
    A. අන්තර්ජාල සේවා සපයන්නෙක්
    B. වෙබ් අතිරික්සුවක්
    C. සුදුසු සන්නිවේදන උපාංගයක්
    1. A පමණි  2. B පමණි  3. A හා B පමණි
    4. B හා C පමණි  5. ඉහත සියල්ල ම
30. පිටු සලකුණු (Book Marks), අලුත් ටැබ (New Tab), ඉතිහාසය (History) යන මේවා පහත කුමන මෘදුකාංගයක ඇති අංග ද?
    1. වදන් සැකසුම් (Word Processing)
    2. පැතුරුම් පත් (Spread Sheet)
    3. මෙහෙයුම් පද්ධති (Operating System)
    4. වෙබ් අතිරික්සු (Web Browser)
    5. ත්‍රිමාන සජීවිකරණ (3D Animation)
31. ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවිය වන www.nie.lk හි ".lk" ලෙස දක්වා ඇත්තේ?

1. වසම් නාමයයි (Domain Name)
2. නියමාවලියයි. (Protocol)
3. ගොනු නාමයයි. (File Name)
4. ඉහළ මට්ටමේ වසම් නාමයයි. (Top Level Domain)
5. ගොනු බහලුම් නාමයයි.

32. පරිශීලකයා සිටින ස්ථානය සිතියම් මෘදුකාංගයක් හරහා සොයා ගැනීමට ඇතැම් ජංගම දුරකථන හා ටැබ්ලට් පරිගණකවල තාක්ෂණයක් යොදා ඇත එය නම්,

1. GPS
2. SMS
3. Wi-Fi
4. Bluetooth
5. Skype

33. Google Drive, Sky Drive, Dropbox යන මේවා මගින් සපයන සේවාව කුමක් ද?

1. නොමිලේ දුරකථන ඇමතුම් ලබා දීම.
2. නොමිලේ විද්‍යුත් තැපැල් ගිණුම් ලබා දීම.
3. වීඩියෝ සම්මන්ත්‍රණ සඳහා පහසුකම් සැපයීම.
4. ගොනු ගබඩා කිරීමේ පහසුකම් සැලසීම.
5. නොමිලේ වෙබ් අඩවි පවත්වා ගැනීමට ඉඩ සැලසීම.

34. සෙවුම් යන්ත්‍රයක් සඳහා උදාහරණයක් වන්නේ පහත කුමක් ද?

1. Google Chrome
2. MSN
3. Firefox
4. Opera
5. Internet Explorer

35. අන්තර් ජාලය විසින් ලබා දෙන සේවාවක් නො වන්නේ ?

1. වෛරස් මුදා හැරීම.
2. ඉ-තැපැල
3. ඉ-වාණිජ්‍යය
4. ලෝක විසිරි වියමන
5. ඉ-අධ්‍යාපනය

36. සම්පත් නිශ්චායකයක් (URL) සම්බන්ධයෙන් වූ පහත ප්‍රකාශ සලකන්න.

A. එහි භාවිත කරන ප්‍රොටොකෝලය ඇතුලත් ය.
B. එහි වෙබ් අඩවියේ වසම් නාමය (Domain Name) ඇතුළත් ය.
C. එහි ඉහළ මට්ටමේ වසම් නාමය (Top Level Domain Name) අඩංගු ව ඇත.
D. එහි වෙබ් අඩවියට අදාළ වෙබ් පිටුවල නම් අඩංගු වෙයි.
E. එහි තොරතුරු ඇතුළත් පොදු බහලුමේ (Folder) නම ඇතුළත් ය.

මෙයින් සත්‍ය වන්නේ?

1. A, B, C හා D පමණි
2. B, C, D හා E පමණි
3. A, B, D හා E පමණි
4. B, C, හා D පමණි
5. ඉහත සියල්ල ම

---

**බහුවරණ - (පිළිතුරු)**

| | | | |
|---|---|---|---|
| 1-2 | 11-2 | 21-4 | 31-4 |
| 2-4 | 12-4 | 22-2 | 32-1 |
| 3-2 | 13-3 | 23-1 | 33-4 |
| 4-5 | 14-2 | 24-3 | 34-2 |
| 5-2 | 15-1 | 25-4 | 35-1 |
| 6-4 | 16-2 | 26-1 | 36-5 |
| 7-4 | 17-3 | 27-2 | |
| 8-2 | 18-3 | 28-4 | |
| 9-3 | 19-1 | 29-5 | |
| 10-3 | 20-3 | 30-4 | |